**නිවිතිගල ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 18 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම නිශ්චිතව හඳුනානොගෙන 2012 ජනවාරි සිට 2015 අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ලැබිය යුතු රු. 6,854,500 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) කර්මාන්ත බදු හා බලපත්‍ර ගාස්තු වල සමාලෝචිත වර්ෂයට අදාල බිල්කල ආදායම හඳුනාගැනීමකින් තොරව වර්ෂය තුලදී ලැබුණු රු. 1,065,869 ක් වූ ආදායම වර්ෂයේ බිල්කල ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) වැටුප් ප්‍රතිපූර්ණ ලේඛනය අනුව 2016 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපූර්ණය වියයුතු මුළු වැටුප රු. 1,710,614 ක් වුවද, එය රු. 1,805,614 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 95,000 ක් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 32,125 ක් වූ පුස්තකාල පොත් ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුම මඟින් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබුණු රු. 32,740 ක් වූ පාරිභෝජ්‍ය භාණ්ඩ 17 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව එකතුව රු. 480,850 ක් වූ වත්කම් වෙන්දේසි කිරීමට හෝ විනාශ කිරීමට නිර්දේශ කර තිබූ නමුත් වෙන්දේසි කිරීමකින් තොරව ගිණුම් වලින් ඉවත් කර තිබුණි.

(උ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ ඉඩම් හා ගොඩනැගිලි ඇතුලත් කර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

**----------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 16,668,150 ක වෙනසක් විය.

(ආ) වැය විෂයයන් 15 කට අදාලව වැය ලෙජරය හා මූල්‍ය ප්‍රකාශන අතර රු. 1,430,410 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

**-------------------**

සභාවේ සේවක ණය ලේඛනය අනුව, 2007 වර්ෂයට පෙර සිට පැවත එන රු. 19,017 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

-------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| | ---------------------------------------- | ------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 1645 | සමාලෝචිත වර්ෂයට අදාල ධාවන සටහන් 2017 ජූනි වනවිටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාවේ වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,434,016 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 2,278,963 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,155,053 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 4,155,053 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 04 ක රු. 3,506,919 ක වර්ධනය හා වියදම් විෂයයන් 02 ක රු. 2,251,971 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

## 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 2,525 | 2,847 | 1,518 |
| බදු කුලී | 4,076 | 3,882 | 62 |
| බලපත්‍ර ගාස්තු | 273 | 335 | 01 |
| වෙනත් ආදායම් | 37,246 | 31,391 | 11,199 |

## 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බලපත්‍ර ගාස්තු හා සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 32, සියයට 23 හා සියයට 79 කින් වැඩි වී තිබූ අතර වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 64, සියයට 27 හා සියයට 23 කින් අඩුවී තිබුණි.

## 2.3.3 වරිපනම්

2016 දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 958 කින් එකතුව රු. 1,189,286 ක හිඟ වරිපනම් ශේෂයක් පැවති අතර, 2017 පෙබරවාරි 07 දින වනවිටත් එම හිඟ මුදලෙන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

**2.3.4 වෙනත් ආදායම්**

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ අංක 39 යටතේ දක්වා ඇති 2 වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දැන්වීම් ප්‍රදර්ශනයේදී අයදුම්පත්‍රයක් ලබා ගැනීමකින් තොරව ගාස්තු අයකර තිබූ අතර, සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය වෙමින් පවතින ප්‍රචාරක දැන්වීම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර අදාල ආදායම් සභාව වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර බදු ලේඛනය අනුව 2016 දෙසැම්බර් 31 දිනට අක්කර බදු ඒකක 257 කින් එකතුව රු. 167,553 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවති අතර, එය සභා බල ප්‍රදේශයේ මුළු අක්කර බදු ඒකක ගණනින් සියයට 81 ක ප්‍රතිශතයක් විය.

(ඇ) නිවිතිගල නගරයේ නවතා තබන රථ වාහන වලින් ගාස්තු අය කිරීම සඳහා සභාව විසින් රථ වාහන පාලිකාවක් කොමිස් පදනම මත පත් කරගෙන තිබූ අතර, 2016 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තුව වශයෙන් රු. 31,000 ක් පමණක් එකතුකර තිබුණි. එකතු කරන මුදලින් සියයට 70 කට සමාන කොමිස් මුදලක් එම පාලිකාවට ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ආදායම වශයෙන් රු. 9,300 ක් පමණක් සභා අරමුදලට අයවී තිබුණි. තවද, ගාස්තු අයකිරීමේ කාර්යය විධිමත් පරිදි සිදු නොවන බව විගණනය විසින් සිදු කරන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ ගොඩනැගිලි නියෝගයන්ට කරන ලද සංශෝධනයන්හි V වන උපලේඛනය පරිදි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී අයකල යුතු ගාස්තු වලට පටහැනි ලෙස දුරකථන කුළුණු 06 කින් අඩුවෙන් ගාස්තු අයකිරීමත්, දුරකථන කුළුණු 03 කින් කිසිඳු ගාස්තුවක් අය නොකිරීමත් හේතුවෙන් සභා අරමුදලට රු. 1,201,200 ක් අහිමි වී තිබුණි.

(ඉ) 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ “ඇ” කොටසේ නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සිදුකල යුතු වුවද, සභාව විසින් 2016 වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර 03 ක් පමණක් නිකුත් කර තිබූ අතර, බල ප්‍රදේශය තුල පවතින පරිසර

ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන සම්බන්ධයෙන් 2017 පෙබරවාරි 07 දින වනවිටත් සමීක්ෂණයක් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) සභා බල ප්‍රදේශය තුල පැවැත්වෙන සංදර්ශන වෙනුවෙන් සභාව විසින් විනෝද බදු අයකල යුතු වුවත්, 2016 වර්ෂය තුලදී සභාව විසින් කිසිදු විනෝද බදු ආදායමක් උපයා නොතිබූ අතර, විනෝද බදු පිළිබඳව 2016 වර්ෂයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කිරීමටද කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 කාර්යසාධනය**

---

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සභා අරමුදල් යටතේ ප්‍රාග්ධන ව්‍යාපෘති 02 ක් සඳහා රු. 500,000 ක් ඇස්තමේන්තුගත කර තිබූ අතර, සභා අරමුදල්, පළාත් සභා අරමුදල් සහ වෙනත් ආධාර යටතේ රු. 39,703,535 ක් වැයකර සංවර්ධන ව්‍යාපෘති 91 ක් ඉටුකර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

2015 වර්ෂයේ හිඟ වරිපනම් බදු අයකිරීමේ හා දේපළ තහනම් කිරීමේ කටයුතු සඳහා සියයට 15 ක කොමිස් පදනම මත දේපළ තහනම් කිරීමේ නිළධාරියෙකුගේ සේවය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් විසින් 2016 මාර්තු මාසයේදී ලිපියකින් අනුමැතිය ලබාදී තිබූ නමුත් එම කොමිස් ගෙවීමේදී රු. 60,120 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුල පැවති ක්‍රීඩා පිටි 03 න් දෙකක මැනීම් කටයුතු සිදුකර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල පැවති සුසාන භූමි 75 ක් මැනීම් කටයුතු සිදුකර සභාව වෙත පවරා ගැනීමට 2017 පෙබරවාරි 07 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) පොලිස් පැමිණිලි සටහන අනුව 2016 ජූලි 04 වන ඉරිදා දිනක සභාවේ කැබ් රථයේ විදුලි පද්ධතියට වූ අනතුර සම්බන්ධයෙන් රක්ෂණ ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමේදී අනතුර සිදුවූ දිනය 2016 ජූලි 03 වන දින ලෙස දැක්වීම, අනතුර සම්බන්ධයෙන් තහවුරු සාක්ෂි ලබා ගැනීම සඳහා ධාවන

සටහන් සහ බැහැර යාමේ ලේඛනය විගණනයට ඉදිරිපත් නොකිරීම, අනතුර සිදුවූ දිනයේ ක්ෂේත්‍ර රාජකාරී වලදී කිසිදු ආදායමක් උපයා නොගැනීම හා 2017 ජූනි වනවිටත් මෙම කැබ් රථය අළුත්වැඩියා කිරීමෙන් තොරව සභා භූමියේ ගාල්කර තැබීම යන කරුණු හේතුවෙන් මෙම අනතුර සිදුවූ දිනයේ කැබ් රථය කුමන රාජකාරියක් සඳහා යෙදුනේද යන්න ප්‍රශ්නගත විය.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් සෘජු ශ්‍රම පදනම යටතේ රු. 331,492 ක් වැයකර 2016 දෙසැම්බර් 20 දින නිම කර තිබූ පොදු වෙළඳපල සංකීර්ණයේ වැසිකිළිය අළුත්වැඩියාව සඳහා බිත්ති ටයිල් 325 ක් මිලදී ගෙන තිබූ අතර, එම මුළු ටයිල් ප්‍රමාණයම නිකුත් කර තිබූ ලෙස තොග පොතේ සටහන් කර තිබුණද, 2017 අප්‍රේල් 06 දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව මෙම කර්මාන්තය සඳහා බිත්ති ටයිල් 200 ක් පමණක් භාවිතා කර තිබූ අතර, ගබඩාවේ බිත්ති ටයිල් 87 ක් පැවති බව අනාවරණය විය. ඒ අනුව, රු. 13,727 ක් වූ බිත්ති ටයිල් 38 ක් සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් ලබාදීමට කාර්මික නිළධාරියා අපොහොසත් විය.තවද, වැසිකිලිය සඳහා විදුලිය වෙනුවෙන් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අතර ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂය සඳහා වෙන වෙනම භාවිතා කල හැකි පරිදි ඉදිකර නොතිබුණි.

(ආ) කරවිට ජල ව්‍යාපෘතියේ ජල මූලාශ්‍රය වනසතුන්ගේ ක්‍රියාකරකම් වලින් ආරක්ෂා කිරීම, ජල මූලාශ්‍රයේ පවිත්‍රතාවය සුරැකීම සහ ජල මූලාශ්‍රයට ආපදාවක් සිදුවීම වැළැක්වීම සඳහා එකතුව රු. 369,908 ක් වැයකර කරවිට ජල යෝජනා ක්‍රමයේ රක්ෂිතය වටා අඩි 720 ක් දිගැති ආරක්ෂිත වැටක් ඉදිකර තිබුණු අතර, ආරක්ෂිත වැටෙහි අඩි 10 ක ප්‍රමාණයක් ඉදිකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු නිසි පරිදි ඉටු නොවන බව 2017 අප්‍රේල් 06 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) පළාත් සභාවේ ප්‍රතිපාදන මත ඉකුත් වර්ෂයකදී ඉදිකරන ලද කර්මාන්තයක් වෙනුවෙන් ගෙවන ලද රු. 200,000 ක අත්තිකාරම් මුදල් 2017 පෙබරවාරි 03 දින වනවිටත් පියවා නොතිබුණි.

## 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අයකිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණි. එසේම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ 9.4 වන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව දරිද්‍රතාවය හේතුකොටගෙන සභාව විසින් නිදහස් කරනු ලැබූ පදිංචිකරුවෙකු නොවන, කසළ ශෝධන සේවාව මඟින් සේවය සලසනු ලබන යම් ස්ථානයක පදිංචිකරුවෙකු විසින් සභාව ඒ සඳහා නියම කරනු ලබන කසළ ශෝධන ගාස්තුවක් සභාව වෙත මාස්පතා ගෙවනු ලැබිය යුතුය. එසේ වුවද, සභාව විසින් කසළ ශෝධනය සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට 2017 පෙබරවාරි 07 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

## 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ වැය විෂයයන් 10 කට සැලසූ එකතුව රු. 165,800 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම 2016 සැප්තැම්බර් 21 දින අනුමත කර තිබුණි.

## 4.4 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා ක්‍රියාත්මක කර නොතිබුණි.

**4.5 අභ්‍යන්තර විගණනය**

**------------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.6 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

**----------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දින වනවිට ගණනය කල හැකි ගනුදෙනු වල වටිනාකම රු. 741,465 ක් වූ විගණන විමසුම් 01 ක් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) වැඩියෙන් සටහන් කිරීම |
| | | (ii) වර්ගීකරණ දෝශ |
| | | (iii) ගිණුම් වලින් අත්හැරීම් |
| | | (iv) නොසැසඳීම් |
| (ආ) | ආදායම් පරිපාලනය | නියමිත ආදායම හඳුනානොගැනීම |
| (ඇ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය | ගාස්තු අයනොකිරීම |